## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

### 4P ව්‍යාපෘති සඳහා ගොවීන් තෝරාපත් කර ගැනීමේ නිර්ණායක

1. <u>සුදුසුකම්</u>

- ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල තෝරාගත් ග්‍රාම නිලධාරී වසම්වල පදිංචි හෝ කෘෂිකාර්මික කටයුතු වල නිරත ගොවීන් විය යුතුය.
- තෝරාගන්නා ගොවින්ගෙන් 90%ක් හෙක්ටයාර එකට වඩා අඩු වගාබිමක් හිමි කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාරිකයන් විය යුතුය.
- තෝරාගන්නා ගොවීන්ගෙන් 90%ක් අඩු ආදායම්ලාභි ගොවින් විය යුතුය.
- නීතිමය වශයෙන් පිළිගත් වගාවිමක් හිමි ගොවින් විය යුතුය (අයිතිකරු/බද්දට හෝ කුලියට ගත්).
- යටිතල පහසුකම් හා ජල සැපයුම: වගාබිම සඳහා අඛණ්ඩව ජලය සම්පාදනය කිරීමේ හැකියාව.

2. <u>විශේෂිත කෘෂිකාර්මික නිෂ්පාදන</u>

- කෘෂි ව්‍යාපාරික කටයුතු සඳහා සක්‍රීයව සහ අඛණ්ඩව සම්බන්ධ වීමේ හැකියාව.
- ව්‍යාපෘතිය මඟින් සංවිධාන කරනු ලබන පුහුණු වැඩමුළු සඳහා සහභාගි වීමේ අවශ්‍යතාවය.
- කුසලතා හා අත්දැකීම් බෙදාගැනීම සඳහා ගොවි සංගමයක සාමාජිකත්වය දැරීම.
- ව්‍යාපෘතිය මගින් ප්‍රවර්ධනය කරන හඳුන්වාදෙන නව කෘෂිකාර්මික ක්‍රියාකාරකම් අනුගමනය කිරීමේ හැකියාව.

3. <u>වෙළඳපළ ඉලක්ක කරගැනීමේ හැකියාව</u>

- ව්‍යාපෘති ප්‍රවර්ධකයා සමඟ මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට සූදානම් වීම.
- හවුල්කරුවන්ගේ ඉල්ලුමට සරිලන පරිදි ගුණාත්මක කෘෂි නිෂ්පාදන අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ලබා දීමේ හැකියාව.

පසුගිය වසර 5 තුළ රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් කෘෂි ව්‍යාපාර/ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිවලින් (SAPP, ASMP, CSIAP) දැනටමත් ප්‍රතිලාභ ලබාගෙන ඇති ගොවින් මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා නොගත යුතුය.